**ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය - 2017**
**------------------------------------------------------------**

ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයේ 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1998 අංක 51 දරන ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩල පනතේ 22 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

**------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**1.3 විගණකගේ වගකීම**

**---------------------**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI-1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදි. ආචාරධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීමද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් මණ්ඩලයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම ද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2 මූල්‍ය ප්‍රකාශන

## 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 2**

මුදල් ප්‍රවාහ ප්‍රකාශනය පිළියෙල කිරීමේදී ක්‍රියාකාරකම් නිශ්චිතව හඳුනාගෙන ගිණුම් කාලපරිච්ඡේදයට අදාළ මූල්‍ය චලනයන් පමණක් සැලකිල්ලට ගත යුතු වුවද ආරම්භක උපචිත වියදම් ශේෂය තුළ ඇති ප්‍රාග්ධන වත්කම් මිලදී ගැනීම සඳහා උපචිත කරන ලද වියදම ඉවත් නොකර කාරක ප්‍රාග්ධන සංචලනය තුළ ගැලපීම හේතුවෙන් මෙහෙයුම් ක්‍රියාකාරීත්වය තුළින් ජනිතවූ ශුද්ධ මුදල් ප්‍රවාහය රු. 2,032,625 කින් අඩුවෙන් දක්වීම හේතුවෙන් මුදල් ප්‍රවාහ ප්‍රකාශනය නිවැරදිව පිළියෙල කර නොතිබුණි.

**(ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 3**

ගිණුම්කරණ ඇස්තමේන්තුවල වෙනස්වීම් මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කළ යුතු වුවද මණ්ඩලයේ ස්ථාවර වත්කමක්ව පැවති පිරිවැය වටිනාකම රු. 1,200,610 ක්වූ බිතු සිතුවම 2018 වර්ෂය අවසානයේ සිට මණ්ඩලය විසින් ඉවත් කර ඇති බැවින් මේ සම්බන්ධව වත්කමෙහි ජීවකාලය පිළිබඳව සිදුව ඇති ඇස්තමේන්තුවල වෙනස්වීම් මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කිරීම් කර නොතිබුණි.

### 2.2.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති

මණ්ඩලය විසින් තොග පිරිවැයට අගය කළ බව හෙළිදරව් කර තිබූ නමුත් සියළුම තොග අගය කිරීම සඳහා එම ප්‍රතිපත්තිය අනුගමනය කර නොතිබූ අතර පිරිවැය හැර වෙනත් පදනම් යටතේද තොග අගය කර තිබුණි.

**2.2.3 ගිණුම්කරණ අඩුපාඩු**

---------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ

(අ) පුනරාවර්තන ප්‍රතිපාදන භාවිතා කර ස්ථාවර වත්කම් අත්පත් කරගැනීමේදී ඒ සඳහා දරා තිබූ රු.155,081 ක් වූ මුදල පුනරාවර්තන ප්‍රතිපාදනයෙන් රාජ්‍ය ප්‍රාග්ධන ප්‍රදාන ගිණුමට මාරු කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) ලේඛක ආධාර ව්‍යාපෘතිය සඳහා වර්ෂයේ අයවැය ප්‍රතිපාදන ඉක්මවා ගිවිසුම්ගතවීම නිසා 2017 දෙසැම්බර් 31 දිනට ලේඛකයන් 49 දෙනෙකු වෙනුවෙන් ගෙවීමට ඇති රු.3,215,953 ක් ගිණුම්ගත කර නොතිබුණි.

(ඇ) 2017 දෙසැම්බර් 31 දිනට ගිණුම් අනුව පොත් තොගය වටිනාකම රු.4,367,889 ක් වූ අතර භෞතික සත්‍යාපන වාර්තා අනුව වටිනාකම රු.7,895,098 ක් වූයෙන් මූල්‍ය ප්‍රකාශනවල තොගය රු.3,527,209 ක් අඩුවෙන් දක්වා තිබුණි.

**2.2.4 පැහැදිලි නොකළ වෙනස්කම්**

------------------------------

2012 වර්ෂයේ සිට පැවත එන පොත් තොග ඒකක 3,457 ක තොග ඌණතාවය පිළිබඳ වගකිවයුතු අය හඳුනාගෙන අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

**2.2.5 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා**

-----------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ

(අ) ප්‍රාග්ධන සංචිත ගිණුමේ අවසාන ශේෂය රු.23,678,741 ක් වූ නමුත් ඊට අදාළ බැංකු ශේෂය රු. 22,448,787 ක් වූයෙන් රු. 1,229,954 ක් වූ වියදම් නොකරන ලද වෙන්කිරීම් මුදලින් නියෝජනය නොවීම.

(ආ) 2017 දෙසැම්බර් 31 දිනට ආපදා ණය ශේෂය රු.12,762,122 ක් වූ අතර ආපදා ණය ලේඛනය අනුව ශේෂය රු.12,827,184 ක් වූයෙන් වෙනස රු.65,062 ක් හඳුනාගත නොහැකි ශේෂයක් ලෙස පසුගිය වර්ෂයේ සිට මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර තිබුණි.

**2.2.6 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම**

-----------------------------------------

1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛයෙහි 2(අ),(ආ),(ඉ) වගන්ති සහ 2009 සැප්තැම්බර් 01 දිනැති හා අංක ඩීඑම්ඒ/2009(2) දරන කළමනාකරණ විගණන චක්‍රලේඛය ප්‍රකාරව සියළුම ස්ථාවර වත්කම් වෙනුවෙන් සම්මත වර්ගීකරණයක් ඇති කිරීම, වත්කම් හඳුනා ගැනීම, ගිණුම්ගත කිරීම හා ඒවායේ පාලනය පහසු කරවීම සඳහා එක් එක් ස්ථාවර වත්කම් වෙනුවෙන් දෙපාර්තමේන්තුමය අංකයක් මගින් වත්කම් හඳුනාගෙන ලේඛනගත කිරීම යන කාර්යයන් ඉටු නොකිරීම හේතුවෙන් මූල්‍ය ප්‍රකාශන අනුව 2017 දෙසැම්බර් 31 දිනට පිරිවැය වටිනාකම රු. 171,324,300 ක් වූ වත්කම්වල පැවැත්ම තහවුරු කර ගැනීමට නොහැකි විය. ඉන් වටිනාකම රු.106,790,091 ක් වූ ජාතික පුස්තකාල සංරක්ෂිත පොත් තොගය 1976 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා වසර 41 කින් සමීක්ෂණය කර නොතිබුණි.

## 2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

---------------------------------

### 2.3.1 ලැබිය යුතු ගිණුම්

------------------

වටිනාකම රු.248,496 ක් වූ විවිධ අත්තිකාරම් ශේෂය වර්ෂ 8 කට වඩා වැඩි කාලයක සිට පියවා නොතිබුණි. මෙයින් රු.121,970 ක් වූ ශේෂය හඳුනාගත නොහැකි අත්තිකාරම් ලෙස මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර තිබුණි.

### 2.3.2 ගෙවිය යුතු ගිණුම්

------------------

දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් වෙත ප්‍රේෂණය කළ යුතු වර්ෂ 2 සිට වර්ෂ 11 දක්වා පැරණි රු.750,215 ක් වූ රඳවා ගැනීම් බදු මුදල් 2019 ජුලි 18 දින දක්වාම දේශීය ආදායම් කොමසාරිස් වෙත ප්‍රේෂණය කර නොතිබුණි.

## 2.4 නීති රීති , රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

----------------------------------------------------------------------

පහත සඳහන් නීති රීති , රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම් |
| --- | --- |
| (අ) 1998 අංක 51 දරන ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩල පනතේ 7 වගන්තිය | අමාත්‍යවරයාගේ පූර්ව අනුමැතිය යටතේ කමිටු පත් කිරීම හා ඒවායේ ක්‍රියාකාරීත්වය සම්බන්ධයෙන් රීතීන් සැකසීම මණ්ඩලය විසින් සිදුකළ යුතු වුවත්, එකතු සංවර්ධන ප්‍රතිපත්තිය යටතේ ප්‍රකාශන මිලදී ගැනීම් නිර්ණය කිරීමේ කමිටුව පත් කිරීමේදී අමාත්‍යවරයාගේ පූර්ව අනුමැතිය ලබා ගෙන නොතිබුණු අතර කමිටුවේ ක්‍රියාකාරීත්වය සම්බන්ධයෙන් වසර 20 කට වැඩි කාලයක සිට රීතීන් සකස් කිරීම සිදුකර නොතිබුණි. |
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| (i) මුදල් රෙගුලාසි 507 4 (අ),(ආ) වගන්ති | ගිණුම් පොත්වල සටහන් කර ඇති ප්‍රමාණය හා සැබවින්ම තිබෙන තොග ප්‍රමාණය අතර වෙනස හා ඒ පිළිබඳව ද අතැති තොගවල පොත් අගය හා සමීක්ෂණ මණ්ඩලයේ තක්සේරුව අතර යම් විෂමතාවයක් ඇතොත් ඒ පිළිබඳව ද ගණන් දීමේ නිලධාරියා මුදල් රෙගුලාසි 757 ප්‍රකාරව වෙනම ක්‍රියාකළ යුතු වුවත් එසේ කටයුතු කර නොතිබුණි. |

| | |
|---|---|
| (ii) මුදල් රෙගුලාසි 756 5(අ) වගන්තිය | බඩු හරි වැරදි බැලීම සඳහා ටී සහ ඒ 66 ආකෘති පත්‍රය භාවිතා කළ යුතු වුවත් එම ආකෘතිය භාවිතා නොකිරීම හේතුවෙන් සමීක්ෂණය කරන ලද දිනට බඩු වට්ටෝරු පොතෙහි සඳහන් ශේෂය සමීක්ෂණ වාර්තාවල සටහන් කර නොතිබුණි. |
| (iii) මුදල් රෙගුලාසි 1646 වගන්තිය | වාහන භාර නිලධාරින් විසින් ගමන් පිළිබඳ මාසික සාරාංශයේ මුල් පිටපත ද සමඟ ඒ ඒ මාසයේ ධාවන සටහන් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. |
| :) 2002 නොවැම්බර් 28 දිනැති අංක අයි/ඒ/අයි/ 2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | පරිගණක, පරිගණක උපාංග හා මෘදුකාංග සම්බන්ධ ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වාගෙන ගොස් නොතිබුණි. |
| :) 2015 ජූලි 10 දිනැති අංක 02/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කිරීමෙන් වන සියළුම ආදායම් ඒකාබද්ධ අරමුදලට බැරකළ යුතු වුවත් මහා භාණ්ඩාගාරය සමඟ වාචිකව එකඟ වූ කරුණු අනුව මෙහෙයුම් කල්බදු ක්‍රමය යටතේ මණ්ඩලය වෙත ලබාදෙනු ලබන වාහනවල මුල් වර්ෂයේ මාසික කුලිය එම මුදලින් ගෙවීම සඳහා වාහන විකිණීමෙන් ලද රු. 2,710,862 ක් වූ මුදල බැංකු ගිණුමට බැරකර තිබුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මණ්ඩලයේ මූල්‍ය ප්‍රතිඵලය රු. 7,801,955 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.14,817,209 ක් වීමෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.7,015,254 ක වර්ධනයක් පෙන්නුම් කෙරුණි. ඉකුත් වර්ෂයට සාපේක්ෂව පරිපාලන වියදම් රු. 7,291,540 කින් සහ පුස්තකාල සේවා වියදම් රු. 1,308,222 කින් වැඩි වුවද සමාලෝචිත වර්ෂයේ රාජ්‍ය ප්‍රදාන රු. 12,700,000 කින් වැඩිවීම හා රු. 2,130,466 ක්වූ දේපල පිරියත හා උපකරණ විකුණුම් ලාභය ඉහත වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 4 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2013 වර්ෂයේදී රු.13,747,104 ක්වූ ඌනතාවය සමාලෝචිත වර්ෂය වන විට රු. 7,801,955 ක් දක්වා අඩුවී තිබුණි. එහෙත් සේවක පාරිශ්‍රමික, ජංගම නොවන වත්කම් සඳහා වූ ක්ෂය නැවත ගැලපීමෙන් පසු 2013 වර්ෂයේ දී රු.55,556,073 ක්වූ මණ්ඩලයේ දායකත්වය සමාලෝචිත වර්ෂය අවසානයට රු.102,455,957 ක් දක්වා වර්ධනය වී තිබුණි.

**4. මෙහෙයුම් සමාලෝචනය**

**4.1 කාර්යසාධනය**

**4.1.1 ක්‍රියාකාරීත්වය සහ සමාලෝචනය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වෙළුම් හතරකින් හා ප්‍රස්තාවනාවකින් යුතු පන්සියපනස් ජාතක පොත පොත් 5 කින් සමන්විත වේ. එය නැවත මුද්‍රණය සඳහා අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවට පවරා තිබූ නමුත් එම කටයුතු නිමකර නොතිබුණි. මේ හේතුවෙන් නැවත මුද්‍රණ කටයුතු මණ්ඩලය විසින් සිදුකිරීමට 2015 වර්ෂයේදී අනුමැතිය ලබාගෙන තිබුණු අතර පොත් 5 න් ප්‍රස්ථාවනාව සහ වෙළුම් 2 ක් 2017 වසර තුළ නිමකර තිබුණි. ඉන් III හා IV වෙළුම් විගණිත දින වූ 2019 ජුනි 21 දින දක්වාත් මුද්‍රණය කර ආපසු භාරදී නොතිබුණි.

(ආ) 1850 වර්ෂය දක්වා ප්‍රකාශනයට පත්ව ඇති පැරණි සාහිත්‍ය ග්‍රන්ථ නාමයන් සහ 1851 සිට 2000 වර්ෂය තෙක් එයට අදාළව ප්‍රකාශයට පත්ව ඇති සංස්කරණයන් ඇතුළත් කරමින් සාධිකාරී සිංහල ග්‍රන්ථ නාමලේඛනය සම්පාදනය කිරීමේ කටයුතු 2014 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මෙහි ඇතුළත් කර තිබූ නමුත් විගණිත දිනය වූ 2019 ජුනි 21 දින දක්වාත් නිමකර නොතිබුණි.

(ඇ) ක්‍රියාකාරී සැලැස්මෙහි සඳහන් කාර්යයන් සඳහා යෝජිත සියළුම වැඩසටහන් පිළිබඳව පූර්ව සැලසුම් සකස් කරනු ලැබිය යුතු වුවත් මණ්ඩලයේ ක්‍රියාකාරී සැලැස්මෙහි සඳහන් සමහරක් කාර්යයන් වෙනුවෙන් පැවැත්වීමට යෝජිත වැඩසටහන් පිළිබඳව පූර්ව සැලසුම් සකස් කරනු නොලබන අතර වර්ෂය තුළදී ලැබෙන ඉල්ලීම් සලකා බලා වැඩසටහන් තෝරාගෙන ක්‍රියාත්මක කර තිබුණි.

(ඈ) ක්‍රියාකාරී සැලැස්මෙහි සඳහන් සියළුම කාර්යයන් වෙනුවෙන් ඒ ඒ වැඩසටහන් සඳහා වෙන වෙනම විස්තරාත්මක අයවැයක් සකස් කරනු ලැබිය යුතු වුවත් ඒ අනුව විස්තරාත්මක අයවැයක් සකස් කර නොතිබුණි.

(ඉ) 2017 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මෙහි ඇතුළත් කාර්යයන් 2 ක් ඉටුකර නොතිබූ බව නිරීක්ෂණය විය.

**4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මණ්ඩලය විසින් සම්භාව්‍ය කෘති නැවත මුද්‍රණය යටතේ මුද්‍රණය කරන ලද ප්‍රකාශන අතරින් විකුණුම් වටිනාකම රු.8,166,980 ක් වූ ප්‍රකාශන 4 කට අදාළව ප්‍රකාශනවල විකුණුම් මිල මුද්‍රණය කර නොතිබුණි.

(ආ) පූජාවලිය ග්‍රන්ථය ප්‍රකාශන අංශයෙන් ගබඩාවට මාරු කර යැවීමේදී පොත් 57 ක ඌනතාවයක් සිදුවී තිබූ අතර එහි විකුණුම් වටිනාකම රු.138,510 ක් විය.

**4.3 මානව සම්පත් කළමනාකරණය**

---------------------------------

(අ) හිටපු අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ප්‍රධාන විධායක තනතුරේ සිට ඉල්ලීම් සිදුකර පත්වීම් දිනයේ සිට බලපැවැත්වෙන පරිදි අධ්‍යක්ෂ ජනරාල් තනතුරේ 10 වන වැටුප් පියවරේ තැබීමට අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (පාලන) ගේ අනුමැතිය ලබාගෙන තිබුණි. මේ සම්බන්ධයෙන් 2012 මැයි 22 දින ප්‍රකාශයට පත් කරන ලද රාජ්‍ය ව්‍යාපාර කාරකසභා තීරණය විගණිත දිනය වූ 2019 ජුනි 21 දින දක්වාත් ක්‍රියාවට නංවා නොතිබූ බව නිරීක්ෂණය විය.

(ආ) මණ්ඩලයේ පැවති පුරප්පාඩු 7 ක් පිරවීම සඳහා 2018 අප්‍රේල් මාසයේ දී සම්මුඛ පරීක්ෂණයක් පවත්වා ඒ අනුව පුරප්පාඩු 4 ක් පමණක් පුරවා තිබූ නමුත් පුරප්පාඩු 3 ක් නොපිරවීම.

**4.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

-----------------------------

2015 ජූලි 10 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 02/2015 හි ආකෘති අංක 02 පරිදි වාහන අපහරණ කාර්යය නිමකර ඒ පිළිබඳව සවිස්තරාත්මක වාර්තාවක් රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල් වෙත ඉදිරිපත් කළයුතු අතර එහි පිටපතක් රාජ්‍ය ගිණුම් අධ්‍යක්ෂ ජනරාල්, භාණ්ඩාගාර මෙහෙයුම් අධ්‍යක්ෂ ජනරාල්, ජාතික අයවැය අධ්‍යක්ෂ ජනරාල් හා විගණකාධිපති වෙත යොමුකළ යුතු අතර රාජ්‍ය ව්‍යවසායන් වන විට රාජ්‍ය ව්‍යාපාර අධ්‍යක්ෂ ජනරාල් වෙත ද යොමුකළ යුතු වුවත් මණ්ඩලය විසින් ඊට අනුකූලව කටයුතු කර නොතිබුණි.

**4.5 අරමුදල් ඌන උපයෝජනය**

------------------------------

ප්‍රසම්පාදන කටයුතු සැලසුම් කරන ලද වර්ෂය තුළදීම සිදු නොකිරීම නිසා රාජ්‍ය ප්‍රාග්ධන ප්‍රදාන ගිණුමේ වසරින් වසර ඉතුරුවෙමින් පැවත ආ ශේෂය 2017 ජනවාරි 01 දිනට රු. 30,442,949 ක් විය. සමාලෝචිත වර්ෂය සඳහා රු. 9,000,000 ක ප්‍රාග්ධන ප්‍රදාන ලැබී තිබුණු අතර සමාලෝචිත වර්ෂයේ රු.15,764,208 ක් පමණක් වැයකර තිබුණි. ඒ අනුව ප්‍රසම්පාදන කටයුතු සැලසුම් ප්‍රකාරව ඉටුනොකිරීම හේතුවෙන් 2017 දෙසැම්බර් 31 දිනට රු 23,678,741 ක් උපයෝජනය නොකර රඳවා තබාගෙන තිබුණි.

**5. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය**

--------------------------------------

**5.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

------------------------------

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 වගන්තිය ප්‍රකාරව මූල්‍ය වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත මූල්‍ය ප්‍රකාශන හා කෙටුම්පත් වාර්ෂික වාර්තාව විගණකාධිපති වෙත හා එහි පිටපත් අදාළ අමාත්‍යාංශයට, මහා භාණ්ඩාගාරයේ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කළ යුතු වුවද, 2017 වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන විගණනය සඳහා ඉදිරිපත් කර තිබුණේ අවුරුදු 1 මාස 3 ක ප්‍රමාදයකින් පසුව 2019 ජුනි 12 දින දීය. තවද 2018 ගිණුම් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන සහ 2017 වර්ෂය සඳහා වූ කෙටුම්පත් වාර්ෂික වාර්තාව මෙම වාර්තාවේ දිනය දක්වාත් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.

**5.2 මුල්‍ය ප්‍රකාශන, පොත්පත් හා ලේඛන පැවැත්වීම**

---

2017 වර්ෂය ආරම්භයේ සිට ගණුදෙනු හා සිද්ධීන් සිදුවන අවස්ථාවේදීම හෝ ආසන්න දිනකදී ලෙජරයෙහි සටහන් කිරීම මණ්ඩලය විසින් සිදුකර නොතිබූ අතර 2017 වර්ෂය සඳහා ලෙජර් ගිණුම් විගණිත දිනය වූ 2018 ඔක්තොම්බර් 01 දින දක්වාත් පිළියෙල කර නොතිබුණි. 2019 ජුනි මස මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමෙන් පසුව ලෙජරය පිළියෙල කර ඉදිරිපත් කර තිබූ අතර එහි පිටු අංක කිරීම ගිණුම් පිළිවෙලට ගොණු කිරීම හා ලෙජර ගිණුම් නම් කර හා අංක කර නොතිබුණි.

**5.3 ප්‍රසම්පාදනය හා කොන්ත්‍රාත් ක්‍රියාවලිය**

---

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ජාතික පුස්තකාලය වැඩිදියුණු කිරීම සඳහා ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ ශීර්ෂ 240-02-02-02-2503-103-11 යටතේ ප්‍රතිපාදන අංක 113 මගින් රුපියල් මිලියන 500 ක අතිරේක ප්‍රතිපාදන ජාතික අයවැය අධ්‍යක්ෂ ජනරාල් විසින් 2017 වර්ෂය තුළදී අධ්‍යාපන අමාත්‍යාංශයේ 126-01-02-02-06-2102 සහ 2104 යටතේ වෙන්කර දී තිබුණි. එම ප්‍රතිපාදනයෙන් පුස්තකාල ගොඩනැගිල්ල නවීකරණය සඳහා රුපියල් මිලියන 211 ක් පමණක් වෙන්කර ඉන් 2019 ජුලි 25 දින වන විට රුපියල් මිලියන 147 ක වියදම් අමාත්‍යාංශය විසින් දරා තිබුණි.

(ආ) මධ්‍යගත වායු සමීකරණ පද්ධතිය ස්ථාපිත කිරීමේ කාර්යයට අදාල කොන්ත්‍රාත් වටිනාකම (වැට් රහිත) රු.59,180,857 ක් වූ අතර ඒ වෙනුවෙන් විචලතා ඇණවුම් 04 ක් හා අමතර වැඩ පත්‍රිකා 05 ක් සඳහා රු.7,187,709.91 ක බිල්පත් ඉදිරිපත් කර තිබුණි. අතිරේක වැඩ, අමතර වැඩ හා විචලතාවයන් කොන්ත්‍රාත් මිලෙන් සියයට 10 ඉක්මවා රු.1,269,624 ක් වූ අතර රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය- 2006 හි 8.13.4 වගන්තිය ප්‍රකාරව අවිනිශ්චිත ප්‍රතිපාදන ඉක්මවීම සඳහා විචලන නියෝග නිකුත් කර නොතිබුණි.

(ඇ) මධ්‍යගත වායු සමීකරණ පද්ධතියේ කාර්ය නිමකර 2017 ජුලි මස 7 දින භාරදෙන ලද බව ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශය විසින් දන්වා තිබුනද එහි හඳුනාගෙන තිබූ අඩුපාඩු එදිනට නිමකර නොතිබුණි.

(ඈ) මණ්ඩලයේ අංශ කිහිපයක් විසින්ම මුද්‍රිත ද්‍රව්‍ය මිලදී ගෙන තිබුණු නමුත් වර්ෂය තුළදී කොපමණ මුද්‍රිත ද්‍රව්‍ය මිලදී ගෙන තිබුණේද යන්න පරීක්ෂා කිරීමට හැකි පරිදි තොරතුරු ලේඛන ගත කර නොතිබුණු අතර 2017 වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම තුළ ඒ සඳහා සැලසුම් කර නොතිබුණි.

(ඉ) රජයේ ප්‍රසම්පාදන කාර්ය සංග්‍රහය 2006 හි යොමු අංක 4.2.1 හි සවිස්තර ප්‍රසම්පාදන සැලැස්ම සඳහා වන ආකෘතියට අනුකූලව ආයතනයේ සවිස්තර ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙළ කර නොතිබුණි.

(ඊ) ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය හා ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය එක්ව දිවයිනේ දිස්ත්‍රික්ක 25 ආවරණය වන පරිදි ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය ද ඇතුළත්ව ප්‍රධාන මහජන පුස්තකාල ආශ්‍රිතව ඩිජිටල් පුස්තකාල 26 ක් වසර දෙකක් තුළ ආරම්භ කිරීමට සැලසුම් සම්පාදනය කර තිබුණි. මේ සඳහා රු.මිලියන 225 ක් ඒකාබද්ධ අරමුදල යටතේ වෙන්කර ගැනීමට යෝජිතව පැවතිණි. 2017 අප්‍රේල් 01 දිනෙන් ආරම්භ කර 2019 අප්‍රේල් 01 දිනෙන් අවසන් වීමට පැවති ව්‍යාපෘතියෙහි පළමු අදියර සඳහා ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය ද ඇතුළුව පුස්තකාල 7 ක් තෝරාගෙන තිබුණි. මේ සම්බන්ධව පහත නිරීක්ෂණයන් කෙරේ.

(i) 2018 දෙසැම්බර් 14 දිනැති 170 වැනි අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී අවබෝධතා ගිවිසුම් අත්සන් කිරීම සඳහා අනුමැතිය ලබාදී තිබූ නමුත් ව්‍යාපෘති කාලය අවසන් වන විටත් අදාළ අවබෝධතා ගිවිසුම් වලට එළඹ නොතිබීම හේතුවෙන් ව්‍යාපෘති කටයුතු අවසන් වීමෙන් පසුව නඩත්තු කටයුතු හා සේවා සම්බන්ධයෙන් අනුගමනය කළ යුතු ක්‍රියා පරිපාටි සහ ඒ සඳහා මූල්‍ය දායකත්වයන් සම්බන්ධයෙන් එකඟතාවයන් ඇති කරගෙන නොතිබුණි.

(ii) ව්‍යාපෘති කාලය අවසන් වන විට ආරම්භ කිරීමට යෝජිත පුස්තකාල 26 න් පළමු අදියර යටතේ පුස්තකාල 6 ක් පමණක් වැඩ ආරම්භ කර තිබුණි.

**5.4 නොවිසඳී ඇති විගණන ඡේද**

-----------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2014 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන කාර්යාල ලී බඩු උපකරණවල පිරිවැය වටිනාකම වූ රු.23,089,464 ක් තුළ වටිනාකම රු.936,787 ක් වූ ජංගම වත්කම් තොගයක් ඇතුළත්වී තිබුණි.

(ආ) මූල්‍ය ප්‍රකාශනවල එකතු වටිනාකම රු.1,306,632 ක් වූ වත්කම්වලට අදාළ වත්කම් පංතිය හඳුනා නොගැනීම හේතුවෙන් එම වත්කම් ක්ෂය කර නොතිබුණි.

**6. පද්ධති හා පාලනයන්**

----------------------

විගණනයේ දී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින් වර මණ්ඩලයේ සභාපතිගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

| | පද්ධති හා පාලන ක්ෂේත්‍ර | | නිරීක්ෂණ |
|---|---|---|---|
| (අ) | වත්කම් පාලනය | | වත්කම් ලේඛනගත නොකිරීම. |
| | | ii) | පොත් වාර්ෂිකව සමීක්ෂණය නොකිරීම. |
| (ආ) | ගිණුම්කරණය | i) | මූල්‍ය ප්‍රකාශන නියමිත වේලාවට ඉදිරිපත් නොකිරීම. |
| | | ii) | ලෙජර ගිණුම් හා උපලේඛන අතර නොසැසඳීම් පැවතීම. |
| | | iii) | ලෙජර ගිණුම්හි සටහන් තැබීමේ දී වවුචර් අංක සඳහන් නොකිරීම. |
| | | iv) | ගබඩා තොග පාලන ලෙජරය පවත්වාගෙන නොයාම. |
| | | v) | ලෙජර ගිණුම් යාවත්කාලීනව පවත්වාගෙන නොයාම. |
| | | | වැය ලෙජරයෙහි සහ ලෙජරයෙහි සටහන් අධීක්ෂණ නිලධාරියා විසින් සහතික නොකිරීම. |
| (ඇ) | ප්‍රසම්පාදනය | (i) | සැලසුම් අනුව කටයුතු නොකිරීම. |
| (ඈ) | මුද්‍රිත ද්‍රව්‍ය මිලදී ගැනීම | (i) | සැලසුම් නොකිරීම. |
| | | (ii) | පූර්ව අවශ්‍යතාවන් හඳුනා නොගැනීම. |